# සැළලිහිණි සන්දේශය

- **මෙය සිංහල සාහිත්‍ය වංශයෙන් උපුටා ගන්නා ලදී**

කෝට්ටේ කාලයේ ලියැවුණු තුන්වන සන්දේශය සැළලිහිණිය යි. මෙය ලියැවෙනවිට සිරිපැරකුම්බාගේ දූ වන උලකුඩය හෙවත් ලෝකනාථා කුමරියට නන්නූර්තුනයා සමග විවාහය සිටියා ය. සිංහාසනයට උරුමකම් ඇත්තේ ඇගේ පුතුට ය. එහෙයින් ඇයට පුතකු දෙනු මැනවයි නන්නූර්තුරයා මැතිගේ නාමයෙන් දෙවියන් යැදීම පිණිස සැළලිහිණියෙකු දූත මෙහෙයෙහි යොදවා කැළණියේ විභීෂණ දෙවියන්ට යවන අයදුම්පතක් සේ මේ සන්දේශය කර තිබේ. පරෙවියෙන් උපුල්වන් දෙවියන්ට කළ ආරාධනය ඉටු නොවීම නිසා මේ අස්න විභීෂණ දෙවියන් වෙත යැවීමට සිතාගත්තා වැන්න. මෙහි ඇත්තේ කොට්ටේ සිට කැළණිය දක්වා වූ කෙටි ගමනක විස්තරයකි. ගමනෙහි දූතයාට නවාතැන් ගතයුතු වූයේ එක් තැනකදී පමණි. එය සවසක ගමන් ඇරඹූ නිසාය. සුබ නැකතකින් ගමන මෙහෙයැවූ බව ඉන් පැහැදිලි වේ. පැරණි සිංහල සන්දේශාවලියෙහි ඉතා ම කෙටි සන්දේශය මෙයයි. මෙහි ප්‍රමාණය කවි 108 කි.

**ගරුතර නන්නුරුතුනයා නැමැති මැ  ති**
**සිහිකර නිතර මහපුද පඬුරු දී රු  ති**
**නොවිසර ඔබට දන්වන ලෙස කී ස්තැ  ති**
**සුරවර මදක් කල් එපවත් ඇසිය යු  ති (96)**

මේ කවියෙන් කියැවෙන අයුරු මේ පණිවිඩය කියවන සේ නියොග බරන්නේ නන්නූර්තුනයා මැතිය. සිංහල සන්දේශාවලියෙහි සන්දේශය යවන්නාත් කතුවරයාත් එක් කෙනෙකු මිස, දෙන්නෙකු වූ තැනැක් නැත. එහෙයින් සැළලිහිණියෙහි කතුවරයා සන්දේශය යවන්නා වූ නන්නූර්තුරනයා ය යන අදහසක් පහළවීමට ඉඩ තිබේ. එහෙත් පොතේ අවසානයෙහි එන

**කඳවුරු කුල මැඳුර මිණිපහනෙව් සුසැ  දී**
**නැණගරු සබස සමයද දනුමෙන් වොරැ  දී**
**රජගුරු විජයබා පිරුවන් හිමි පැහැ  දී**
**මෙම්යුරු පදනි සැළලිහිණිය අස්න යෙ  දී**

මේ කවියෙහි සැළලිහිණිකරු විජයබා පිරුවන්පති බව දැක්වේ. මේ විජයබා පිරිවෙන්පති නම්, කෝට්ටේ සමයෙහි ප්‍රසිද්ධ පඬිවරයා ව සිටි සිරි රහල් හිමි ය. ඒ නිසා සැළලිහිණිය රාහුල කෘතියක් හැටියට සම්මත වී තිබේ.

රාහුල හිමියන් මේ සන්දේශය ලියා ඇත්තේ පැරකුම්බා රාජ්‍යයෙන් 35වන වසරේ බව පොතේ අග කිය වේ. එනම් ක්‍රිස්තු වර්ෂ 1450 දී පමණය. එය කෝකිල සන්දේශ සටහනේ දී පෙන්වා ලූ පරිදි සපුමල් කුමරු ආර්ය චක්‍රවර්තීන් අතර සිදු වූ දෙවන සටනින් පසු අවස්ථාවයි.

සැළලිහිණි කවි රාහුල හිමියන්ගේ පිරිපුන් කවිත්වය පිළිබිඹු කරන ඒවායි.  කවි සමයවත්, අනුකරණයවත්, සැළලිහිණි කවිවල ඇති බවක් නොපෙනේ. වස්තුව දෙස බලා සිතෙහි පිළිබිඹු වූ වස්තු තත්ත්වය සිලිටි පදයෙන් පැවසූ සැටියකි ඒ කවිවලින් දැක්වෙන්නේ එහෙයින් සැළලිහිණිය සභාවික දර්ශනයත්, කවියාගේ ප්‍රතිභානයත් පිළිබිඹු කරන රචනයකි. පහත සඳහන් කවි ඒවා කියවා බැලීමේදී ඒ බව දත හැකිය.

**සුරරද සමන් සමගින් සුරගන එව** **ර**
**පැහැනද මදාරා පරසතු මල් පත** **ර**
**කරපුද වඳින රැඳි මුනි සිරිපා තඹ** **ර**
**සකිසඳ පෙණෙන් සමතොළ ගල නැගෙනහි** **ර ( 25 )**

**මනහර නා මෙනෙවියනිද ළවැලි පි** **ට**
**ගෙන මිණි වෙණ තත් නියගින් මැද රුව** **ට**
**කන හෙව කියන බුදු ගුණ ගී මියුරු කො** **ට**
**සැනහෙව කැලණි ගඟ බඩ මඳ කලක් සි** **ට ( 45 )**

ඇසෙන විට වැටහෙන අදහස් ඇති මේ කවිවලට ගැබ් කරවූ අලංකාරයක් නැත. එහෙත් කවියකට අවශ්‍ය කවර දෙයක අඩුවකුත් මෙහි නො පෙනේ. පද පිළිවෙළේ සිලිටිකම, ශ්‍රැතියේ මනහර බව, අදහස් ස්වභාවික බව හා වැනුමේ විසිතුරු බව මේ කවි වල හොඳින් පිළිබිඹු වී ඇත. සැළලිහිණි කවිවල පැනෙන තවත් විශේෂ ගුණයක් නම් ඒවායේ වැනුම් මග ඉක්මවා නොයැමයි. දන්නා නාක් දෙය කියන්නට නොසිතා කිය යුත්තක් ම තෝරාගෙන එය කියා පෑ හැටි සැළලිහිණියේ හැම තැනම පාහේ ම දිස්වෙයි.

සන්දේශ කවි හෝ ඒ ඒ වැනුමෙහි ඒ ඒ විරිත් තැබීම සිරිත්ක් කොට ගත්හ. විශේෂයෙන් නැටුම් වැනුමෙහි දී ඊට සුදුසු විරිත් ගැනීම ඔවුන්ගේ සිරිත විය. එහෙත් රහල් හිමි සැළලිහිණි කරණයේ දී මුල් ගියත් දසපද හැල්ලත් හැරුණ විට යොදා ගත්තේ සමුද්‍රඝෝෂ විරිත පමණි. එයින් කළ නැටුම් වැනුම් අනිත් සන්දේශ නැටුම් වැනුමකට නොදෙවන සේ බැඳී ඇත. එය කවියාගේ සමත්කම කී.

සැළලිහිණියේ පිළිබිඹුවන කවියාගේ තවත් ගුණයක් නම්, ශ්‍රද්ධා භක්තිය යි. එය ඔප්ගන්වා පෙන්වන්නේ කැලණි වන්දනය සඳහා සැළලිහිණියාට නියම කරනු වස් කළ

කව් කීපයේ ය. සන්දේශ කරුවා විසින් විහාර වන්දනය කොතෙක් කරවා ඇතත්, මෙතරම් හොඳින් කළ විහාර වන්දනයක් අන් එක ද සිංහල සංදේශයක නැත. එහෙයින් එය සැළලිහිණියේ විශේෂ තැනකි. වඳින්නට ගිය විට විහාර භූමියෙහි ඇතිනාක් වැඳිය යුතු තැන් පිළිවෙලින් වැඳ එක ම සන්දේශ කරුවාත් සිරිරහල් හිමිය. කිසිම පුද්ගලයකු වැනීමෙහි ආශාවක් රහල් හිමියන් තුළ නොවිය. එහි ඇත්තේ රජු කථානායක - නායිකාවන් පිළිබඳ කෙටි කථනයක් පමණි. එය රාහුල රචනාවල විශේෂයකි.

රාහුල රචනා බෙහෙවින් භාරතීය පඬුවන් ගේ රචනාවල පැනෙන අදහස් වලින් පෝෂිත බව ඒවා විභාගකර බැලීමේ දී පෙනියන කරුණකි. සකු රචනා කිහිපයක අදහස් පරවි පද්‍යයෙහි ද දක්නට ලැබේ. ඒ අනුව සැළලිහිණි කව්වල ද පෙර රචනාවන්හි අදහස් වැටී තිබේ. ඒ සඳහා ඉතා පැහැදිලි ලෙස පෙන්විය හැකි කවිය මෙයයි.

**මිතුරු තුමෝ දුක සැප දෙකෙහිම පැවැ          ති**

**බිතු සිතුවම් රූ මෙන් පිටු නොපා වි          ති**

**යුතු මතු වැඩ මතෙපල එවැනි ගුණ ඇ          ති**

**සිතු නතු කර අස යහළුව වඩන රූ          ති**

මෙහි මුල් පදයේ අදහස මුළුමනින් ගාථාසප්තශතී නම් ප්‍රාකෘත කාව්‍යයෙහි ඇත. ඒ මෙසේයි.

**තං මිත්තං කා අව්වං - ජං කිර වසණම්මි දෙස ආලම්මි**

**ආලිහි අභිත්තිවා - උල්ලඅං ව ණ පරම්මුහං ඨාඉ**

මේ පරිද්දෙන් සැළලිහිණි කවි ද සකු කවියන්ගේ රචනාවලට නැකම් දක්වන හැටි මක. තබාගත යුත්තකි. එයින් පෙනෙන්නේ රාහුල හිමියන් නොයෙක් විෂයීය පත්පොත් කියවා පලපුරුද්දක් ඇතුව සිටි බවයි.

රාහුල හිමි දෙවියන් යැදූ පරිදි උලකුඩය දේවියට පුතකු ලැබී තිබේ. මේ කරුණු එවක් පටන් සැළලිහිණි අස්න පුදුම විදියේ ප්‍රචාරයකටත් බුහුමනටත් පාත්‍ර වීමට හේතුවිය. උලකුඩය දේවි ලත් ඒ කුමරු ගජබා නම් විය. හේ පැරකුම් රජුගේ ඇවෑමෙන් ක්‍රිස්තු වර්ෂ 1467 දී රජ පැමිණියේ ය. එහෙත් අවුරුද්දකට පසුව සපුමල් කුමරුන් විසින් ඔහු ඝාතනය කරවා රජකම ගන්නා ලදී. ඉන් ඇතිවූ සිත් වේදනාව නිසා රහල් හිමි වනගත වූ බව සැලයි.

➢ **මෙය සිංහල සාහිත්‍ය වංශයෙන් උපුටා ගන්නා ලදී**